# ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය

## නැගෙනහිර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

## විශ්වවිද්‍යාල ප්‍රවේශ අධ්‍යයන වර්ෂය - 2025/2026

**සංගීතය /නර්තනය / නාට්‍ය හා රංග කලාව /දෘශ්‍ය හා තාක්ෂණික කලා උපාධි වැඩසටහන් පිළිබඳ ලලිත කලා ගෞරව උපාධිය සඳහා ඇතුළත් වීමට සිසුන් තෝරා ගැනීම සඳහා යෝග්‍යතා / ප්‍රායෝගික විභාගය**

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම සුදුසුකම් සහිතව ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතයේ අධ්‍යයන පාඨමාලාවක් හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවට විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කර ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

### ප්‍රවේශ සඳහා අවම අවශ්‍යතා

2025 දී පවත්වන ලද විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් අවම අවශ්‍යතා සපුරා ඇති (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ 2025/2026 අත්පොත බලන්න)

සහ තෝරාගත් විෂය සඳහා අපේක්ෂකයන් අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් (C) සහ අනෙක් විෂයයන් දෙක සඳහා සරල සාමාර්ථයක් (S) ක් ලබා තිබිය යුතුය.

### යෝග්‍යතා /ප්‍රායෝගික විභාග මාධ්‍යය

යෝග්‍යතා /ප්‍රායෝගික විභාගය සඳහා දෙමළ මාධ්‍යයෙන් පමණක් පවත්වනු ලැබේ. (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ 2025/2026 අත්පොත බලන්න).

### අයදුම්පත් ඉදිරිපත් කිරීම

අයදුම්කරුවන් පහත අමුණා ඇති අයදුම්පත මාර්ගගතව පුරවා ඉදිරිපත් කළ යුතුය. තවද, අයදුම්කරුවන් අයදුම්පත්‍රයේ 6වන කොටසේ සඳහන් සියලුම ස්කෑන් කරන ලද ලේඛන 2026.05.13 දින හෝ ඊට පෙර මාර්ගගතව එවිය යුතුය. නිසි ලෙස පුරවන ලද මාර්ගගත අයදුම්පත්‍රය (https://forms.gle/j9Sc6VFJHhxhhTZN6) සමග තාක්ෂණික සහාය සඳහා කරුණාකර ඕනෑම වැඩ කරන දිනකදී පෙ.ව 9.00 සිට ප.ව 4.00 දක්වා 065- 2222663 දුරකථන අංකය හරහා විභාග ශාඛාව අමතන්න.

මාර්ගගත අයදුම්පත් ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමෙන් පසුව නිසි ලෙස පුරවන ලද අයදුම්පත අයදුම්කරුවන් විසින් මුද්‍රණය කර අත්සන් කළ යුතුය. තවද, අයදුම්කරුවන් විසින් යෝග්‍යතා/ ප්‍රයෝගික විභාග දිනයේදී, අයදුම්පත්‍රයේ 6 වන කොටසේ දක්වා ඇති සියලුම මුල් ලියකියවිලි සහ මුද්‍රිත හා අත්සන් කරන ලද අයදුම්පත්‍රය ශ්‍රී ලංකාව, නැගෙනහිර විශ්ව විද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී / විභාග දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.

**අයදුම්පතේ 6 (1) වගන්තිය සඳහා උපදෙස්**

සංගීතය / නර්තනය /නාට්‍ය හා රංග කලාව පිළිබඳ ලලිත කලා (ගෞරව) උපාධිය සඳහා රු.1000/- ක් සහ දෘශ්‍ය හා තාක්ෂණික කලා පිළිබඳ ලලිත කලා (ගෞරව) උපාධිය සඳහා රු.1500/- ක් සඳහා ගෙවීම් වවුචරයක් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය. මෙකී විභාග ගාස්තුව මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකින් ලබාගත යුතු අතර **නියෝජ්‍ය මූලයාධිකාරී, ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය, නැගෙනහිර විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, ගිණුම් අංකය: 075-100110000-767, මහජන බැංකුව, මඩකළපුව ශාඛාව** යන නමින් තැන්පත් කළ යුතුය.

**අයදුම්පතේ 6 (2) වගන්තිය සඳහා උපදෙස්**

අ.පො.ස (උසස් පෙළ) සහතිකවල සහතික කළ පිටපත් අයදුම්පත සමග අමුණා තිබිය යුතුය. සහතිකවල සියලුම පිටපත් පාසලේ විදුහල්පති හෝ සාමදාන විනිශ්චයකාර හෝ ග්‍රාම සේවක නිලධාරී විසින් සහතික කළ යුතුය. මුල් සහතිකපත් එවිය යුතු නොවේ.

**අයදුම්පතේ 6 (3) වගන්තිය සඳහා උපදෙස්**

අයදුම්පතේ දක්වා ඇති නම් සහ සහතික /සහතිකවල, නම් අතර කිසියම් විෂමතාවයක් තිබේ නම්, අපේක්ෂකයන් එකම පුද්ගලයෙකුට අදාළ බව සහතික කරන දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.

ඇතුළත් වීමේ අවශ්‍යතා සපුරා ඇති සෑම අපේක්ෂයෙකුටම විභාගයේ දිනය ලිඛිතව විද්‍යුත් තැපෑලෙන් දැනුම් දෙනු ලැබේ.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් නොලබන නමුත් 2025 දී පවත්වන ලද අ.පො.ස (උසස් පෙළ) විභාගය නැවත සමීක්ෂණය සඳහා අයදුම් කර සිසුන්ට අවශ්‍ය උපකාරක ලියකියවිලි ඉදිරිපත් කිරීමෙන් පසු යෝග්‍යතා / ප්‍රායෝගික විභාගය සඳහා අයදුම් කළ හැකි බව කරුණාවෙන් සලකන්න.

විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අවම ප්‍රවේශ සුදුසුකම් නොමැති අයගේ අයදුම්පත් හෝ ගෙවීම් වවුචර් හෝ සහතිකවල සහතික කළ ඡායා පිටපත් සහ අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් සමග නොලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**නියෝජ්‍ය ලේඛකාධිකාරී,**
**ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනය,**
**කල්ලඩි, මඩකළපුව.**